**සිංහල පරිවර්තනය**

**නිවේදන අංක: R/2025/20**

**උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ජීව වෛද්‍ය ඉංජිනේරු (Bio Medical Engineer) තනතුරේ III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම - 2025**

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්ගේ අංක CP/DEC/25 දරණ 2025.07.16 දිනැති ලිපිය මගින් යොමුකරන ලද 2025.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/04/01/Recruitment/2025 දරණ 2025.08.04 දිනැති නිර්දේශ ලිපියට අනුව **උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ජීව වෛද්‍ය ඉංජිනේරු** තනතුරේ **III** ශ්‍රේණියේ පවතින තනතුරු පුරප්පාඩු **හතරක් (04)** සඳහා බඳවා ගැනීම වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම බඳවාගැනීම සඳහා පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2026 ජනවාරි මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.01.05** වේ.

## **01.** බඳවා ගැනීමේ සේවා කොන්දේසි

01.1 2016.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක ශ්‍රේණියේ නිලධාරි සේවයේ **ජීව වෛද්‍ය ඉංජිනේරු** තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, පළාත් මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **2310/29** දරණ **2022.12.14** දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ මෙම තනතුර හා සම්බන්ධ කලින් කලට නිකුත් කරනු ලබන නියමයන්, විධිවිධාන යනාදියට යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් **ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරේ III ශ්‍රේණියට** පත්කරනු ලැබේ.

01.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් පත් තෝරාගන්නා අයදුම්කරුවන් පත්වීමේ දින සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව **ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරේ III ශ්‍රේණියට** පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි **ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරේ III ශ්‍රේණියට** පත් වූ දින සිට වසර **තුනක් (03)** ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

01.3 මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් "උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය" යන කොන්දේසියට යටත් විය යුතුය.

01.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අයදුම්කරුවෙකු, එකී සේවා ස්ථානයේම "අවම වශයෙන් **වසර 05 ක්** අඛණ්ඩව සේවය කළ යුතුය" යන්න අනිවාර්ය කොන්දේසියකි.

01.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

01.6 පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 02. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **10/2025** ප්‍රකාර **SL-1-2025** වැටුප් කේතය අනුව **ජීව වෛද්‍ය ඉංජිනේරු** තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය රු**.82,150 - 10 X 2,400 - 8 X 2,940 - 17 X 3,900 = රු.195,970/=** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## 03. සාමාන්‍ය සුදුසුකම්

03.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

03.2. අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. අයදුම්කරු මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිරව පදිංචි වී සිටිය යුතු වේ.

**එසේ නැතහොත්**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය**.**

**(* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී** තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය**)**

03.3. අයදුම්කරු උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා **ශාරීරික, මානසික යෝග්‍යතාවයකින් යුතු විය යුතුය.**

03.4. අයදුම්කරු යහපත් චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

03.5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 21** ට නොඅඩු සහ වයස **අවුරුදු 35** ට නොවැඩි විය යුතුය.

03.6. අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට හෝ ඊට පෙර සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

## 04. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

### 04.1 අධ්‍යාපන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් **ජීව වෛද්‍ය ඉංජිනේරු** (Bio Medical Engineering) ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබිය යුතුය.

### 04.2 පළපුරුද්ද

පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

## 05. බඳවා ගැනීමේ පරිපාටිය

05.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් සහ කුසලතා පදනම මත බඳවා ගැනීමේ අවස්ථාවේ බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවාගැනීමේ පටිපාටිය, සේවා ව්‍යවස්ථාව, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව, **ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරේ III ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ. මෙම දැන්වීමේ සඳහන් කර ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ.

05.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් අයදුම්කරුවන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

## 06. විභාග ගාස්තුව

අයදුම්කරු, අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු.500/= මුදලක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ලැබෙන පරිදි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ගෙවා, අදාළ ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 07. අයදුම්කිරීමේ පිළිවෙල

07.1 මෙම නිවේදනය සමග නිකුත් කර ඇති අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් නිල වෙබ් අඩවියට පිවිස බාගත කරගෙන සම්පූර්ණ කළ අයදුම්පත, **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

07.2 අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/202"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07.3 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ.

07.4 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

## 08. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

අයදුම්කරුවන් ස්වකීය අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමන හෝ එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

## 09. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම ව්‍යාහුගත සම්මුඛ පරීක්ෂණයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු ව්‍යාහුගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යාහුගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන විට හෝ ව්‍යාහුගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 10. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, නීතිඥවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, සමාදාන විනිශ්වයකාරවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ස්ථිර රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

## 11. විභාග පරිපාටිය

මෙය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකි. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ලකුණු ලබාදෙනු ලැබේ. **(මුළු ලකුණු 100)**

| අංකය | ලකුණු ලබාදෙන විෂයය ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **01** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | **50** |
| 01.1 | ජීව වෛද්‍ය ඉංජිනේරු (Bio Medical Engineering) / විදුලි ඉංජිනේරු (Electrical Engineering) / විද්‍යුත් ඉංජිනේරු (Electronics Engineering) පශ්චාත් උපාධිය (Master's Degree) | 30 | **30** |
| 01.2 | ජීව වෛද්‍ය ඉංජිනේරු (Bio Medical Engineering) / විදුලි ඉංජිනේරු (Electrical Engineering) / විද්‍යුත් ඉංජිනේරු (Electronics Engineering) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (Post Graduate Diploma) | 20 | |
| 01.3 | ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා (Diploma) | 10 සෑම එකක් සඳහාම | **20** |
| **02** | **පළපුරුද්ද** | | **20** |
| 02.1 | ජීව වෛද්‍ය ඉංජිනේරු (Bio Medical Engineering) / විදුලි ඉංජිනේරු (Electrical Engineering) / විද්‍යුත් ඉංජිනේරු (Electronics Engineering) ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද | | |
| 02.1.1 | එක් එක් වර්ෂයකට | 10 | **20** |
| 02.1.2 | මාස 06 කට වැඩි වර්ෂයකට අඩු කාල පරිච්ඡේදයකට | 05 | |
| **03** | **ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ප්‍රකාශන** | | **25** |
| 03.1 | ක්ෂේත්‍රයට අදාළව ප්‍රසිද්ධ කරන ලද පර්යේෂණ හා ප්‍රකාශන | 10 | **10** |
| 03.2 | ක්ෂේත්‍රයට අදාළව අයදුම්කරු විසින් රචනා කර ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශන/සඟරා | 05 සෑම එකක් සඳහාම | **15** |
| **සටහන: පර්යේෂණ ලිපි කිසියම් ප්‍රකාශනයක ඇතුළත් කර ග්‍රන්ථයක් ලෙස ප්‍රසිද්ධ කර තිබේ නම් ඒ සඳහා පුද්ගලික ලකුණු ලබාදෙනු නොලැබේ.** | | | |
| **04** | ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුර හා සම්බන්ධ දැනුම හා කුසලතාව සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාදෙන ලකුණු | | **05** |
| | **මුළු ලකුණු** | **100** | |

<u>සටහන</u>

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් අයදුම්කරුවන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

12. මෙම නිවේදනයේ සඳහන් වන හෝ සඳහන් නොවන කරුණුවලින් අනාවරණය වන / නොවන කිසියම් අපැහැදිළිතාවයක් සම්බන්ධයෙන් හෝ සංශෝධන කිරීම පිළිබඳව උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ. එසේම කිසියම් විශේෂ කරුණු හේතුවෙන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නොහැකි වුවහොත් ඒ පිළිබඳව උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ගන්නා තීරණය අවසන් තීරණය වේ.

13. මෙම තනතුරට අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරිමේ දී, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳ අවසන් තීරණය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුවේ.

**සැළකිය යුතුය:-**

(i). මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ii). මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දූරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

(iii). මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

**ආල්වාප්පිල්ලෙ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
2025.12.18